**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව**

**2021 පෙබරවාරි 2 ලෝක තෙත් බිම් දිනය සැමරීම නිමිත්තෙන්**
**අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය මත**
**වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මධ්‍යම පරිසර අධිකාරිය ඒකාබද්ධව**
**විජය පුවත්පත් සමාගමෙහි මාධ්‍ය අනුග්‍රාහකත්වයෙන් පවත්වනු ලබන**
**දීප ව්‍යාප්ත තෙත් බිම් පිළිබඳ කෙටි ඉදිරිපත් කිරීමේ (short presentation competition) තරඟය - 2021**

ලෝකයේ ජෛව විද්‍යාත්මකවත්, පරිසර විද්‍යාත්මකවත්, ආර්ථික වශයෙනුත්, ඉතා වැදගත් ලෙස සැලකෙන තෙත්බිම් පරිසරය ආරක්ෂා කර ගැනීමෙහිලා ශ්‍රී ලංකාව ද පාර්ශවකරුවෙකු වේ. වර්ථමාන තෙත්බිම් පරිසරයට ඇතිවී තිබෙන තර්ජන හේතුවෙන් මේවා විශාල ලෙස විනාශ වී යමින් පවතී. ජෛව පද්ධතියට පරිසරයට විශාල වශයෙන් මෙහෙවරක් සිදු කරන මෙම තෙත්බිම් ආරක්ෂා කිරීම හා සංරක්ෂණය කිරීම අප විසින් කළ යුතු කාර්යයකි. එබැවින් තෙත් බිම්වල වටිනාකම පිළිබඳව පාසල් සිසුන් මෙන්ම ප්‍රජාව දැනුවත් කිරීම තුළින් තෙත් බිම් සංරක්ෂණයෙහිලා සුබවාදී ආකල්ප වර්ධනය කිරීමේ අරමුණින් මෙම තරඟය පැවැත්වේ.

1. තරඟය පිළිබඳව විස්තර -

(i) මෙවර ලෝක තෙත් බිම් දින තේමාව වන "තෙත් බිම් සහ ජලය" "Wetlands and Water" යන ප්‍රධාන තේමාවට ගැලපෙන තම නිවස ආසන්නයේ පිහිටි හෝ තමන් කැමති ඕනෑම තෙත් බිමක් සම්බන්ධව හෝ එහි තෙත්බිමක වටිනාකම පිළිබඳව මයික්‍රෝ සොෆ්ට් පවර් පොයින්ට් (micro soft power point) ආධාරයෙන් කෙටි ඉදිරිපත් කිරීමේ (short presentation ) නිර්මාණය කළ යුතු ය. මෙම කෙටි ඉදිරිපත් කිරීම අවසානයේ තෙත් බිම් සංරක්ෂණය කිරීමේ වැදගත්කම පිළිබඳව පණිවිඩය ලබාදී තිබිය යුතු ය. එහි දී පහත විස්තර ඇතුළත් කළ යුතු ය.
- තෙත් බිමෙහි පිහිටීම (දිස්ත්‍රික්කය,ප්‍රාදේශීය ලේකම් වසම , ග්‍රාම නිලධාරී වසම,ග්‍රාමය පිළිබඳ විස්තර, අදාළ සිතියමක්)
- එහි වටිනාකම (පාරිසරික, සාමාජීය, පුරාවිද්‍යාත්මක, සංස්කෘතිකමය)
- ඊට අදාළ ඡායාරූප
- ප්‍රමාණය (දළ වශයෙන්)

(ii) මෙම කෙටි ඉදිරිපත් කිරීම විනාඩි 2-5 අතර කාලයකට සීමා විය යුතු ය. මේ සඳහා සුදුසු මාතෘකාවක් ද යෙදීමට කටයුතු කළ යුතු ය.

(iii) මේ සඳහා සුදුසු පරිදී ඕනෑම අක්ෂර ප්‍රභේදයක් හෝ අවශ්‍ය පරිදී ඡායාරූප,ශබ්ද,වීඩියෝ දර්ශන යොදා ගත හැකි ය.

(iv) සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවෙන් නිර්මාණ ඉදිරිපත් කල හැකි ය.

2. **අයදුම්කරුවන්ගේ සහභාගිත්වය -**

තරඟය කාණ්ඩ 2 ක් යටතේ පැවැත් වේ.

1. පාසල් අංශය
2. විශ්ව විද්‍යාල සිසුන් සඳහා

<u>පාසල් අංශය</u>

මෙරට සියලු රාජ්‍ය හා පෞද්ගලික පාසල්වල ශිෂ්‍ය/ශිෂ්‍යාවන්ට පහත කාණ්ඩ යටතේ නිර්මාණ ඉදිරිපත් කල හැකි ය.

| | | |
|---|---|---|
| කණ්ඩායම් 01 | - | 6 වසර සිට 8 වසර දක්වා |
| කණ්ඩායම් 02 | - | 9 වසර සිට 11 වසර දක්වා |
| කණ්ඩායම් 03 | - | 12 වසර සිට 13 වසර දක්වා |

විශ්ව විද්‍යාල සිසුන් සඳහා

මෙරට සියලු රාජ්‍ය හා පෞද්ගලික විශ්ව විද්‍යාල වල 1,2,3,4 වන වසර සිසුන් (අවසන් වසර විභාග ප්‍රතිඵල නිකුත් කිරීමට ඇති සිසුන්) හට නිර්මාණ ඉදිරිපත් කල හැකි ය.

3. **ජයග්‍රාහකයින් තේරීම හා ත්‍යාග ලබාදීම පහත වගුවේ සඳහන් පරිදී සිදු වේ -**

| කාණ්ඩායම් | 1 වන ස්ථානය | 2 වන ස්ථානය | 3 වන ස්ථානය |
|---|---|---|---|
| කණ්ඩායම් 01- 6 වසර සිට 8 වසර දක්වා | 30,000 | 25,000 | 20,000 |
| කණ්ඩායම් 02- 9 වසර සිට 11 වසර දක්වා | 30,000 | 25,000 | 20,000 |
| කණ්ඩායම් 03 – 12 වසර සිට 13 වසර දක්වා | 30,000 | 25,000 | 20,000 |
| විශ්ව විද්‍යාල සිසුන් සඳහා | 40,000 | 35,000 | 30,000 |

මීට අමතරව කුසලතා සහතික ද පිරිනැමේ.

4. තරඟ කොන්දේසි -

i. තරඟය සඳහා ඉදිරිපත් වන සියලු පාසල් අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පාසලක ශිෂ්‍ය ශිෂ්‍යාවන් පමණක් විය යුතු ය.
ii. සෑම අයදුම්කරුවකුම අමුණා ඇති ආකෘති අයදුම්පත්‍රය සකස් කර නිසි පරිදි සම්පූර්ණ කර එවිය යුතු ය.
iii. පාසල් අයදුම්කරුවන්ගේ නිර්මාණ ස්වතන්ත්‍ර නිර්මාණයක් බවට මව/පියා/භාරකරු මගින් සහතික කර එවිය යුතු ය.
iv. විනිශ්චය මණ්ඩලය විසින් තෝරා ගන්නා සියලු ජයග්‍රාහී නිර්මාණ එවා ඇති ශිෂ්‍ය/ශිෂ්‍යාවන් තම පාසලෙහි ඉගෙනුම ලබන ශිෂ්‍ය/ශිෂ්‍යාවන් බවට විදුහල්පති/නියෝජ්‍ය විදුහල්පති/සහකාර විදුහල්පති වෙතින් තහවුරු කර ගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි. එසේ නොවන අවස්ථා වල දී එම නිර්මාණ ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.
v. එක් අයදුම්කරුවකු එක් නිර්මාණයක් පමණක් ඉදිරිපත් කල හැකිය.
vi. තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම නිර්මාණ අයදුම්කරුවන්ගේ ස්වතන්ත්‍ර නිර්මාණය විය යුතු අතර මීට පෙර පවත් වන ලද කිසිදු තරඟයකට ඉදිරිපත් කර ජයග්‍රහණය කළ නිර්මාණ නොවිය යුතු ය.
vii. ජයග්‍රාහී නිර්මාණ වනජීවී සංරක්ෂණ දෙපාර්තමෙන්තු හා මධ්‍යම පරිසර අධිකාරියෙහි හා විජය පුවත්පත් සමාගමේ වෙබ් අඩවිවල පළ කරනු ලබන අතර එහි අයිතිය එම ආයතන සතු ය.
viii. ඉදිරිපත් කරන ලද නිර්මාණය නැවත අයදුම්කරුවන් වෙත එවනු නොලැබේ.
ix. සංවිධායක මණ්ඩලය විසින් ජයග්‍රාහී නිර්මාණ වානිජ්‍යාමය පදනමින් නොවන මාධ්‍ය හා ප්‍රචාරක සහ අධ්‍යාපන කටයුතු සඳහා යොදා ගැනීමට අයදුම්කරු එකඟ විය යුතු ය.
x. මෙම තරඟය සඳහා ඉදිරිපත් කරනු ලබන නිර්මාණ නැතිවීම, හානි වීම හෝ ප්‍රමාද වීම පිළිබඳව සංවිධායන මණ්ඩලය විසින් වග කියනු නොලැබේ.
xi. ඉහත තරඟ කොන්දේසිවලට පටහැනිව ක්‍රියාකිරීම, අසම්පූර්ණ අයදුම්පත් එවීම හෝ ප්‍රමාද වී අයදුම් කිරීම නිර්මාණ ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.
xii. ඉහත තරඟයේ විනිශ්චය අදාල ක්ෂේත්‍රයේ ප්‍රවීනයන්ගෙන් සැදුම්ලත් විනිසුරු මඬුල්ලක් විසින් සිදු කරන අතර එම විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

5. නිර්මාණ ඉදිරිපත් කිරීම -

i. මෙම නිර්මාණ භාර ගනු ලබන අවසන් දිනය **2021.01.21 දින වේ.**
ii. **එවනු ලබන සියළු නිර්මාණ හා අයදුම් පත්‍රය ඊ-මේල් පණිවුඩයක් මගින් dwcnrm@gmail.com යන විද්‍යුත් ලිපිනයට එවිය යුතුය. එසේ එවනු එවනු ඊ-මේල පණිවුඩයෙහි මාතෘකාව (subject) "short presentation**

**competition 2021" ලෙස දැක්විය යුතු ය. එලෙස එවනු ලබන ඊ-මේලි පණිවුඩය සඳහා පිළිතුරු පණිවුඩයක් මගින් ආපසු දන්වනු ලබන අතර එසේ නොලැබුනහොත් පහතින් දක්වා ඇති දුරකථන අංක වෙතින් විමසීම් සිදු කල හැකි ය.**

iii. තරඟය පිළිබඳව වැඩිමනත් තොරතුරු www.dwc.gov.lk, www.cea.lk, යන වෙබ් අඩවිවලින් හෝ පහත දුරකථන අංකය මගින් ලබා ගත හැක.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව : 011 – 2888585,ස්වභාවික සම්පත් කළමනාකරණ අංශය
දිගු අංකය 643

අධ්‍යක්ෂ ජනරාල්,
වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අංක 811/A, ජයන්තිපුර පාර,බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

### 2021 පෙබරවාරි 2 ලෝක තෙත් බිම් දිනය සැමරීම නිමිත්තෙන් පවත්වනු ලබන දීප ව්‍යාප්ත කෙටි ඉදිරිපත් කිරීමේ තරඟය (short presentation competition)

1. නිර්මාණයෙහි තේමාව : ........................................................................................
2. i. තරඟකරුගේ නම : ........................................................................................
   ii.ඉංග්‍රීසි භාෂාවෙන් ........................................................................................
3. i.පෞද්ගලික ලිපිනය : ........................................................................................
   ii.ඉංග්‍රීසි භාෂාවෙන් ........................................................................................ .
   දුරකථන අංකය : ස්ථාවර - ................................. ජංගම - .....................................
4. ජාතික හැඳුනුම්පත් අංකය (පාසල් සිසුන් නම් ඇත්නම් පමණක් දක්වන්න) : .........................................
5. විශ්ව විද්‍යාල සිසුන් නම් විශ්ව විද්‍යාල හැඳුනුම්පතෙහි අංකය (එහි පිටපතක් අමුණන්න) : ............................
6. ස්ත්‍රී/පුරුෂ භාවය : ......................
7. උපන් දිනය : ......................................... වයස .....................................
8. i.පාසලේ/විශ්ව විද්‍යාලයේ නම හා ලිපිනය : ........................................................................................
   ........................................................................................
   ii. ඉංග්‍රීසි භාෂාවෙන් : ........................................................................................
   ........................................................................................
   iii පාසලෙ/විශ්ව විද්‍යාලයෙහි දුරකථන අංකය
9. ශ්‍රේණිය : ........................................................................................
10. විශ්ව විද්‍යාල සිසුන් නම් වසර : ........................................................................................

මේ සමඟ ඇති කෙටි ඉදිරිපත් කිරීම මාගේ නිර්මාණයක් බවත් මෙහි සඳහන් සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් තරගය සම්බන්ධයෙන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සඳහන් කර ඇති සියළුම නීති රීතිවලට එකඟ වන බවත්, තව ද ජයග්‍රාහී නිර්මාණ වානිජමය පදනමින් නොවන සංරක්ෂණ කටයුතු හා අධ්‍යාපන කටයුතු සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, මධ්‍යම පරිසර අධිකාරිය හා විජය පුවත්පත් සමාගම විසින් යොදා ගැනීම, ප්‍රදර්ශනය කිරීම පිළිබඳව මා එකඟවන බවත් සහතික වෙමි.

දිනය : ................................... අත්සන : .................................................

**මවගේ/පියාගේ/භාරකරුගේ සහතිකය (පාසල් සිසුන් සඳහා)**

මේ සමඟ අමුණා ඇති කෙටි ඉදිරිපත් කිරීමේ නිර්මාණය ........................... ශ්‍රේණියෙහි ඉගෙනුම ලබන මාගේ පුතණුවන්/දියණිය වන ........................................................................................ ගේ ස්වාධීන නිර්මාණයක් බව සහතික කරමි.

නම : ………………………………………………………………
අත්සන : ………………………………………………………………
දිනය : ………………………………………………………………